**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2018**

**SOC 4239 – සහයෝගීත්ව සමාජ කාර්යවේදය**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග කාලය තුළදී ක්ෂේත්‍ර සටහන් පොත පරිශීලනය කිරීමට අවසර ලැබේ.**

---

1. වැඩකිරීමේ සම්බන්ධතාවයක (Working Relationship) මූලික මූලධර්ම ලැයිස්තුගත කොට, ඔබ සහයෝගීත්ව සමාජ කාර්යවේදියකු වශයෙන් කටයුතු කළ ප්‍රජාව තුළ වැඩකිරීමේ සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමේදී එම මූලධර්ම උපයෝගී කර ගත්තේ කෙසේදැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

2. අවම වශයෙන් සමාජ කාර්යවේදී න්‍යායාත්මක එළඹුම් දෙකක් භාවිත කරමින්, ගැටලු දිශානුගත (Problem - Oriented) සමාජ කාර්යවේදයේ සිට විසඳුම් ගොඩනැගීමේ (Solution - Building) සහයෝගීත්ව සමාජ කාර්යවේදය දක්වා වූ දැනුමේ විතැන් වීම නිදසුන් සහිතව විභාග කරන්න.

3. සහයෝගීත්ව සමාජ කාර්යවේදය හා සම්බන්ධ "සත්‍යාන්ත්‍රික පාලනය" (Cybernetics) තුළදී, විෂය මූලිකවාදි ලෝක දෘෂ්ටියේ (Objectivist World View) සිට අභිසංස්කරණවාදී ලෝක දෘෂ්ටිය (Constructivist World View) දක්වා වූ විතැන්වීම භාවිත කර ඇත්තේ කෙසේදැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

4. ඔබගේ ප්‍රායෝගික ස්ථාපන වැඩ (Practice Placement Work) ඇසුරෙන් නිදර්ශන සපයමින් සහයෝගීත්ව සමාජ කාර්යවේදියාගේ "සහ-කාර්යය භූමිකාව" (Synergetic Role) විභාග කරන්න.

5. ඔබගේ ප්‍රයෝගික ස්ථාපන වැඩ (Practice Placement Work) ඇසුරෙන් නිදර්ශන සපයමින්, ප්‍රබලතා පර්යාලෝකයෙහි, (Strengths Perspective) ප්‍රබලතා සහ සීමා විචාරපූර්වකව සාකච්ඡා කරන්න.

*අ.පි.බ.*